www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**ජෛව පද්ධති තාක්ෂණවේදය - I**
**Bio systems Technology - I**

66 S I

පැය දෙකයි
Two hours

විභාග අංකය : ..................................................................

*සැලකිය යුතුයි.*
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්ණයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරැදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය සපයා දෙන කොටු පත්‍රයේ කතිරයක් යොදා දක්වන්න.**

(01) ජල චක්‍රයේ අවස්ථාවන් කිහිපයක් පහත රූපයේ දැක්වේ.




D මගින් දැක්වෙනුයේ,

(1) වැස්සීම ය. (2) ඇතුලු කාන්දු වීම ය.
(3) අපධාවය ය. (4) හරස් කාන්දු වීම ය.
(5) අතුරු කඩනය ය.

02) බිත්තර විසුරුවන මත්ස්‍යයෙකි,

(1) ගෝල්ඩ්ෆිෂ් (2) ඒන්ජල් (3) අවුරාටස්
(4) ගුරාමි (5) ෆයිටර්

(3) බිම් මැනුම පිළිබඳව <u>*සාවද්‍ය*</u> ප්‍රකාශය වන්නේ,

1 භූ මිතික මැනුමේ දී පොළොවේ සැබෑ ස්වරූපය සලකා මැනුම් කාර්යය සිදුකරයි.
2 තල මිතික මැනුම පෘථිවි තලය මත කුඩා බිම් කොටසක් මැනීමට යොදා ගනී.
3 භූමිතික මැනුමේදී යම් ලක්ෂ්‍යයන් දෙකක් යා කරන රේඛාව වක්‍ර රේඛාවකි.
4 ජාත්‍යන්තර මට්ටමේ සිතියම් පිළියෙල කිරීමේදී භූමිතික මැනුම් ක්‍රම යොදා ගනී.
5 විශාල රටක සිතියම පිළියෙල කිරීමේදී තල මිතික මැනුම් ක්‍රම යොදා ගනී.



Agaram.lk - Keep your dreams alive!
agaram.lk

(04) සෙකි තැටිය යොදා ගනිමින් ජලයේ පරීක්ෂා කළ හැකි ලක්ෂණ වන්නේ,

(1) වර්ණය හා ආවිලතාවය
(2) උෂ්ණත්වය හා ආවිලතාවය
(3) කඨිනත්වය හා වර්ණය
(4) ආවිලතාවය හා කඨිනත්වය
(5) වර්ණය හා උෂ්ණත්වය

(05) පිල් ලකුණු පිළිබඳ ව **සත්‍ය** ප්‍රකාශය අඩංගු වරණය වනුයේ,

(1) මුහුදු මට්ටමට පමණක් සාපේක්ෂව උච්චත්වය දන්නා ස්ථාවර ලක්ෂයකි.
(2) ඕනෑම මට්ටම් ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට පමණක් පිල් ලකුණ අවශ්‍ය වේ.
(3) මට්ටම් ගන්නා ස්ථාන වල පිල් ලකුණු සහ තාවකාලික පිල් ලකුණු දෙවර්ගයම දක්නට ලැබේ.
(4) පිල් ලකුණු වල ඌනික උස ඡායා රේඛනමිතික ක්‍රමය මගින් සොයා ගනියි.
(5) මට්ටම් ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා පිල් ලකුණ යොදා ගනී.

(6) කුකර්බිටේසියේ කුලයේ බෝග බීජ තවාන් දැමීමට වඩාත් සුදුසු තවාන් වර්ගය වන්නේ,

(1) උස්වූ තවාන්
(2) ගිල්වූ තවාන්
(3) නොරිදෝකෝ තවාන
(4) ඩැපොග් තවාන
(5) වැලි තවාන

(07) භූ ජලය පුනරාරෝපණය වැඩි කර ගැනීම සඳහා සිදු නොකළ යුත්තේ,

(1) ශාක වගා කිරීම
(2) ජල වහන කාණු සැකසීම
(3) පසට කාබනික ද්‍රව්‍ය එකතුකිරීම
(4) ජලය රැස්කර තැබීම
(5) පසට මැටි එකතු කිරීම

(08) සමෝච්ඡ සිතියමක එක ළඟ පිහිටි සමෝච්ඡ රේඛා දෙකක් අතර තිරස් දුර,

(1) සමෝච්ච අන්තරය යි.
(2) අනුක්‍රමණය යි.
(3) තිරස් දුර සමතුල්‍යය යි.
(4) අන්තර් නිවේෂනය යි.
(5) උච්චත්වය යි.

(09) ශාක බද්ධ කිරීම පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - ඒක බීජ පත්‍රී ශාක බද්ධ කිරීමට යොදා නොගනී.
B - ඒක බීජ පත්‍රී ශාකවල කැම්බියම් පටකයක් නොමැත.

මේවා අතරින්,

(1) A ප්‍රකාශය සත්‍ය වේ.
(2) B ප්‍රකාශය සත්‍ය වේ.
(3) A හා B ප්‍රකාශ සත්‍ය වන අතර B මගින් A තව දුරටත් පැහැදිලි කෙරේ.
(4) A ප්‍රකාශය පමණක් අසත්‍ය වේ.
(5) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(10) සමෝච්ඡ රේඛා පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් **සත්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) u හැඩැති සමෝච්ඡ රේඛා මගින් නිම්නයක් පෙන්වයි.
(2) සමෝච්ඡ රේඛා දෙකක් අතර සිරස් දුර මගින් බෑවුමේ ස්වභාවය පෙන්නුම් කරයි.
(3) u ආකාර සමෝච්ඡ රේඛා මගින් වැටියක් පෙන්වයි.
(4) කඳු පාමුලක දී සමෝච්ඡ රේඛා දුරස්ථව පිහිටයි.
(5) ක්‍රමවත් සමෝච්ඡ රේඛා මගින් ඒකාකාරී නොවන මතුපිටක් පෙන්වයි.

(11) අන්තර්ජාතික පාංශු විද්‍යාඥයන්ගේ සංගමයෙහි වර්ගීකරණය අනුව රොන්මඩ අංශුවක විෂ්කම්භය වන්නේ,

(1) 2mm ට වැඩි ය. (2) 2 - 0.2mm
(3) 0.2 - 0.02 mm (4) 0.02 - 0.002 mm
(5) 0.002 mm ට අඩු ය.

(12) ජෛවීය අපජල පවිත්‍රණ ක්‍රියාවලිය පිළිබඳ වගන්ති දෙකක් පහත දැක්වේ.

A - ජලයේ දිය වී ඇති කාබනික ද්‍රව්‍ය ක්ෂුද්‍රජීවීන් භාවිත කිරීම මගින් වියෝජනයට ලක්කෙරේ.
B - ස්වායු බැක්ටීරියා මගින් කාබනික ද්‍රව්‍ය කාබන්ඩයොක්සයිඩ්, ජලය සහ ඔවුන්ගේ වර්ධනය සහ ප්‍රජනනය සඳහා අවශ්‍ය ශක්තිය බවට බිඳ හෙලනු ලබයි.

ඉහත වගන්ති අතුරින්,

(1) A වගන්තිය පමණක් නිවැරදි වේ.
(2) B වගන්තිය පමණක් නිවැරදි වේ.
(3) A හා B වගන්ති දෙකම නිවැරදි වන අතර B මගින් A වඩාත් තහවුරුවේ.
(4) A හා B වගන්ති නිවැරදි වන අතර B මගින් A පැහැදිලි නොකරයි.
(5) A හා B වගන්ති දෙකම වැරදි වේ.

(13) යම් ලක්ෂයක පිහිටීම සාපේක්ෂ ලෙස සිතියමක ලකුණු කිරීමේ දී,

A - මූල ලක්ෂය ලෙස ඕනෑම ලක්ෂ්‍යයක් තෝරාගත හැකිය.
B - ශ්‍රී ලංකාවේ වර්තමාන සම්මත ඛණ්ඩාංක පද්ධතියට අනුව පිදුරුතලාගල කඳු මුදුනේ පිහිටා ඇති ලක්ෂ්‍යයෙහි උතුරු ඛණ්ඩාංකය 200, 000 m සහ නැගෙනහිර ඛණ්ඩාංකය 200,000m වේ.
C - සම්මත ඛණ්ඩාංක පද්ධතිය යොදා ගැනීම අනිවාර්ය වේ.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,

(1) A පමණි. (2) B පමණි (3) C පමණි
(4) A හා B පමණි. (5) A, B හා C සියල්ලම

(14) කාලගුණික මධ්‍යස්ථානයක අනිවාර්යයෙන් තිබිය යුතු උපකරණයක් නො වන්නේ,

A) වර්ෂාමානය B) පාංශු උෂ්ණත්වමානය
C) වාෂ්පීකරණ තැටිය D) උෂ්ණත්වමානය

(1) C පමණි (2) B පමණි (3) A හා C පමණි
(4) C හා D පමණි (5) B හා C පමණි

(15) පහත දැක්වෙන්නේ ශාක ප්‍රචාරණ ක්‍රමයක් දැක්වෙන රූප සටහනකි.



මෙම ප්‍රචාරණ ක්‍රමය වන්නේ,

(1) සරල අතු බැඳීම (2) භූමි අතු බැඳීම (3) සංයුක්ත අතු බැඳීම
(4) ගොඩැලි අතු බැඳීම (5) අග්‍රස්ථ අතු බැඳීම



Agaram.lk - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(16) පහත දැක්වෙන්නේ පාංශු ව්‍යුහ ආකාරයකි.



මෙම ව්‍යුහ ආකාරය වන්නේ

(1) කණිකාමය (2) කුට්ටි ආකාරය

(3) තැටි ආකාර (4) ස්තම්භික

(5) තනි කණිකා

(17) රූපයේ දැක්වෙන PQR ත්‍රිකෝණාකාර භූමියේ දැක්වෙන මිනුම් ඇසුරෙන් පහත දී ඇති ප්‍රකාශ සලකා බලන්න




$$A = \frac{1}{2} \times b \times h$$

$$B = \sqrt{s(s-a)(s-b)(s-c)}$$

මෙහි, $$S = \frac{a+b+c}{2}$$

$$c = \sqrt{abtanc}$$

ඉහත සඳහන් PQR ත්‍රිකෝණාකාර භූමියේ ක්ෂේත්‍රඵලය සමාන වනුයේ,

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි

(4) A හා C පමණි (5) A, B හා C සියල්ල ම

(18) පටක රෝපණ ක්‍රියාවලියේ දී පූර්වකය රෝපණ මාධ්‍යය තුළට ආමුකුලනය කිරීම සිදු කරනුයේ,

(1) පිරිසිදු කිරීමේ කාමරය තුළ දී ය. (2) මාධ්‍යය සකස් කරන කාමරය තුළ දී ය.

(3) පූර්වක සංස්ථාපනය කරන කාමරය තුළ දී ය. (4) ගුණන කාමරය තුළ දී ය.

(5) අනවරත ප්‍රවාහ කුටීරය තුළ දී ය.

(19) තල මේස මැනුම් ක්‍රියාවලියේ දී යොදා ගන්නා දර්ශ රේඛය පිළිබඳ ව පහත ප්‍රකාශ සලකා බලන්න.

A - දර්ශ රේඛයේ කාර්යය වනුයේ දෘෂ්ටි රේඛාව නිර්මාණය කිරීම යි.

B - දර්ශ රේඛය මගින් කඳුකර ස්ථානයක් දෙසට පාඨාංකය ගැනීමේ දී දක්න පෙත්තේ ඉහළ සිදුර යොදා ගනී.

C - දර්ශ රේඛයේ වස්තු පෙත්ත හා දක්න පෙත්ත තල මේසයට සමාන්තරව තිබිය යුතු ය.

ඉහත ප්‍රකාශවලින් **සත්‍ය** ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,

(1) A පමණි. (2) B පමණි.

(3) C පමණි. (4) A හා B පමණි.

(5) B හා C පමණි.

(20) පානීය ජල සාම්පලයක පරීක්ෂා කරනු ලබන විවිධ පරාමිතීන් පහත දැක්වේ.

A - වර්ණය

B - මුලු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය

C - ආවිලතාවය

D - කඨිනත්වය

E - මුළු කෝලිෆෝම් බැක්ටීරියා ප්‍රමාණය

ඉහත පරාමිති අතරින් ජලයේ භෞතික පරාමිති වන්නේ,

(1) A හා D පමණි (2) A, B හා C පමණි

(3) D පමණි (4) D හා E පමණි

(5) A, B හා D පමණි.

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

(21) රිකිලි බද්ධ ක්‍රමයක රූප සටහනක් පහත දැක්වේ.

මෙම බද්ධ ක්‍රමය වන්නේ,



(1) කුඤ්ඤ බද්ධය (2) සෑදල බද්ධය
(3) කිරුළු බද්ධය (4) ජිව්හා බද්ධය
(5) ආරුක්කු බද්ධය

(22) දම්වැල් මැනුම යොදා ගත නොහැකි අවස්ථාවක් වන්නේ,
(1) ක්‍රමවත් මායිම් සහිත ඉඩම් මැනීම සඳහා (2) දත්ත ගණන වැඩි ඉඩම් මැනීම සඳහා
(3) භූ විෂමතාව අඩු ඉඩම් මැනීම සඳහා (4) ප්‍රමාණයෙන් කුඩා ඉඩම් මැනීම සඳහා
(5) දත්ත ප්‍රමාණය අඩු ඉඩම් මැනීම සඳහා

(23) ජලයේ කඨිනත්වය ඇතිවීමට හේතු වන්නේ,
(1) කැඩ්මියම් හා ආසනික් ය. (2) පොස්පරස් හා කැල්සියම් ය.
(3) කැල්සියම් හා මැග්නීසියම් ය. (4) පොස්පරස් හා පොටෑසියම් ය.
(5) ක්ලෝරින් හා අයඩින් ය.

(24) පහත දැක්වෙන සංකේත සිතියමක් මත භාවිතා කරනුයේ පිළිවෙලින්,



(1) පාලම, වගුර, ප්‍රපාතය නිරූපණය සඳහා
(2) දුම්රිය මාර්ගය, පඳුරු, ගල් වල නිරූපණය සඳහා
(3) අඩිපාර, පඳුරු, ගල් වල, නිරූපණය සඳහා
(4) අඩිපාර, වගුර, ප්‍රපාතය නිරූපණය සඳහා
(5) අඩිපාර, වගුර, ගල් වල, නිරූපණය සඳහා

(25) පස් නියැදියක් ලබා ගැනීමට යොදා ගන්නා උපකරණය වන්නේ,
(1) පාංශු ද්‍රවමානය (2) කේතු විහිදුම්මානය
(3) පාංශු අවගාරය (4) සෙකි තැටිය
(5) මන්සල් වර්ණ සටහන

(26) සෛල ජනන විභවය මූලධර්මය ලෙස යොදා ගනිමින් සිදු කරනු ලබන ප්‍රචාරණ ක්‍රමය වන්නේ,
(1) අතු බැඳීම (2) බද්ධ කිරීම
(3) ක්ෂුද්‍ර ප්‍රචාරණය (4) බීජ රෝපණය
(5) පැළ තවාන් දැමීම.

(27) සාමාන්‍ය පරිසරයක් තුළ ජලයේ උෂ්ණත්වය වැඩිවීම සමග ප්‍රතිලෝම සම්බන්ධයක් දක්වන්නේ,
(1) pH අගය (2) ලවණතාවය
(3) ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාව (4) බැරලෝහ ද්‍රාව්‍යතාව
(5) විද්‍යුත් සන්නායකතාවය

agaram.lk
Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(28) A - ගොවි මහතකු සිය ළිඳෙහි ජල මට්ටම වියළි කාලයේ දී අඩුවන බවත් , තෙත් කාලයේ දී වැඩිවන බවත් නිරීක්‍ෂණය කරයි.

B - වෙනත් ගොවි මහතකු සිය ළිඳ කැනීමේ දී තද පාෂාණ ස්ථරයක් සිදුරු කිරීමේ දී අධික පීඩනයක් යටතේ ජලය විදින ආකාරය නිරීක්ෂණය කරයි.

ඉහත අවස්ථා දෙකෙහි ළිඳ පෝෂණය කරනු ලබන ජලධර විය හැක්කේ පිළිවෙළින්.

(1) ආටිසියානු නොවන, ආටිසියානු ජලධර වේ. (2) ආටිසියානු, ආටිසියානු නොවන ජලධර වේ.

(3) ආටිසියානු, උලැඟි ජලධර වේ. (4) උලැඟි, ආටිසියානු නොවන ජලධර වේ.

(5) සීමා වූ, අනවහිර ජලධර වේ.

(29) විසිතුරු මසුන් ප්‍රවාහයේ දී ජලයට ලුණු ස්වල්පයක් එකතු කිරීමේ අරමුණ වන්නේ,

(1) ඇමෝනියා අවශෝෂණයට (2) ප්‍රවාහන ආතතිය අඩු කිරීමට

(3) බහිස්‍රාවීය ද්‍රව්‍ය දියවීම වැළැක්වීමට (4) ශ්වසනය පහසුවීමට

(5) කාබන්ඩයොක්සයිඩ් අවශෝෂණයට

(30) පසක දෘශ්‍ය ඝනත්වය පිළිබඳව ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - බෝග වගාව සඳහා සෑම විටම සුදුසු වන්නේ, අඩු දෘශ්‍ය ඝනත්වයක් සහිත පසකි.

B - දෘශ්‍ය ඝනත්වය අඩු පසක පාංශු ව්‍යුහය, වාතනය වැනි බොහෝ භෞතික ලක්‍ෂණ ද ක්‍ෂුද්‍ර ජීවී ක්‍රියා ද යහපත් තත්ත්වයක පවතී.

මෙම ප්‍රකාශ අතරින්,

(1) A පමණක් සත්‍ය වේ.

(2) B පමණක් සත්‍ය වේ.

(3) A හා B ප්‍රකාශ දෙක ම සත්‍ය වේ.

(4) A හා B ප්‍රකාශ සත්‍ය වන අතර B මගින් A වඩාත් පැහැදිලි කෙරේ

(5) A හා B ප්‍රකාශ දෙක ම අසත්‍ය වේ.

(31) ක්‍ෂාරිය පසක් යථා තත්ත්වයට පත් කරගැනීමට පසට එක් කළ යුතු ද්‍රව්‍යයක් වන්නේ,

(1) හුණුගල් ය. (2) ජිප්සම්

(3) සිප්පි කටු කුඩු (4) අළුහුණු

(5) සෝඩා ලයිම්

(32) ගෝල්ඩ් ෆිෂ් මසුන් වගා කිරීමේදී යොදා ගන්නා සිමෙන්ති ටැංකියක වර්ග අඩියක මසුන් දහයක් යොදා ඇත. ටැංකිය $5' \times 10'$ ප්‍රමාණයේ වේ. එක් මත්ස්‍යකුගේ දේහ බර 10 g ක් නම් එම ටැංකියට දිනකට සැපයිය යුතු ආහාර ප්‍රමාණය වනුයේ,

(1) 150 g (2) 300 g (3) 250 g

(4) 500 g (5) 125 g

(33) දම්වැල් මැනීමේ දී දෘෂ්ටි චතුරස්‍රය (optical square) යොදා ගනු ලබන්නේ,

(1) පාදම් රේඛාව ලකුණු කිරීම සඳහා ය. (2) දිශාව සොයා ගැනීම සඳහා ය.

(3) වස්තුවකට ඇති දුර මැන ගැනීම සඳහා ය. (4) අනුලම්බ සෙවීම සඳහා ය.

(5) සහායක මැනුම් ස්ථාන ලකුණු කිරීම සඳහා ය.

(34) කැල්සියම් බහුල බැවින් වගාවට වඩාත් සුදුසු පස් කණ්ඩය වන්නේ,

(1) රතු දුඹුරු පස (2) රතු කහ පොඩ්සොලික් පස

(3) රතු දුඹුරු ලැටසොලික් පස (4) දියසිළු පස

(5) දියළු පස

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(35) කෝලිෆෝම් බැක්ටීරියා අනුමාපන පරීක්ෂාවේ දී භාවිත කරනු ලබන ඇටවුමකි.




A ලෙස නම් කර ඇති නළය,

(1) බීජෞෂණ නළය යි. (2) ගර්බර් නළය යි.
(3) පරීක්ෂණ නළය යි. (4) ඩර්හැම් නළය යි.
(5) ජ්වලන නළය යි.

(36) ලෝම පසක කැටායන හුවමාරු ධාරිතාවය වන්නේ (meq/ 100g)

(1) 5 - 12 (2) 10 - 25 (3) 20 - 40
(4) 30 - 40 (5) 35 - 50

(37) ජෛව පොහොර නිෂ්පාදනය කිරීමට දායකත්වය ලබා දෙන ක්ෂුද්‍ර ජීවියකු වන්නේ,

(1) *Trichoderma* (2) *Bacillus thuringiensis*
(3) *Anabaena azollae* (4) *Thiobacillus denitrificans*
(5) *Agrobactrerium spp.*

(38) ජෛව පද්ධති මත ඇතැම් කාලගුණික පරාමිති ඇති කරන බලපෑම් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ගෝවා, කැරට් වැනි ශාකවල පුෂ්ප හට ගැනීමට වැඩි උෂ්ණත්ව තත්ත්ව අවශ්‍ය වේ.
B - සාපේක්ෂ ආර්ද්‍රතාව අඩුවීමෙන් ශාක රෝග ව්‍යාප්තිය වැඩි වේ.
C - දිවා කළ දිග වැඩිවන විට කිකිළියන්ගේ ලිංගික පරිණතිය ඉක්මන්වේ

ඉහත ප්‍රකාශ අතුරෙන් **නිවැරැදි** වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) C පමණි. (5) B හා C පමණි.

(39) පාංශු ක්ෂුද්‍ර ජීවී කාණ්ඩයක් වනුයේ,

(1) *Isoptera* (2) *Amphipoda* (3) *Protura*
(4) *Protozoa* (5) *Symphyla*

(40)




A හා C අතර උච්චත්ව වෙනස වනුයේ,

(1) 1 m (2) 1.36 m (3) 1.5 m
(4) 1.63 m (5) 1.86 m

(41) අපජලය පිරිසිදු කිරීමේ යාන්ත්‍රික ක්‍රමයක් වන්නේ,

(1) ස්වායු බැක්ටීරියා මගින් කාබනික ද්‍රව්‍ය ජීරණය (2) නිර්වායු බැක්ටීරියා මගින් කාබනික ද්‍රව්‍ය ජීර්ණය
(3) පා වෙන ද්‍රව්‍ය පෙරීමෙන් ඉවත් කිරීම. (4) සක්‍රීය රොන් බොර සෑදීම.
(5) විරංජන කුඩු එකතු කිරීම.

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(42) පැටවුන් බිහිකරන විසිතුරු මත්ස්‍ය වර්ගයකි.

(1) ගුරාමි (2) ගප්පි (3) කාප්

(4) ටෙට්රා (5) ගෝල්ඩ් ෆිෂ්

(43) k ffI È 100 mක් වන නමුත් නිෂ්පාදන දෝෂ නිසා මෙම මිනුම් පටියේ දිග 10 cm ක් දිගින් වැඩි වි ය. මෙම මිනුම් පටිය භාවිත කර හරියටම 400 m දුරක් මැනීම සඳහා මැනිය යුතු දුර වන්නේ,

(1) 399.10 m කි. (2) 399.60 m කි. (3) 399.90 m කි.

(4) 400.40 m කි. (5) 400.60 m කි.

(44) මත්ස්‍ය වර්ධනය සඳහා සුදුසු අවම ඔක්සිජන් සාන්ද්‍රණය වන්නේ,

(1) *3 mg 1 l* කි. (2) *5 mg 1 l* කි. (3) *10 mg 1 l* කි.

(4) *20 mg 1 l* කි. (5) *50 mg 1 l* කි.

(45) *Argulus* යනු ජලජීවී වගාවේ දී විසිතුරු මසුන්ට රෝග ඇතිකරන,

(1) බැක්ටීරියාවකි. (2) බහු සෛලික පරපෝෂිතයෙකි.

(3) දිලීරයකි. (4) වයිරසයකි.

(5) ඒක සෛලික පරපෝෂිතයෙකි.

(46) සිසුන් පිරිසක් ස්ටේඩියා ක්‍රමය මඟින් තිරස් දුර මැනීමේ දී ඉහළ ස්ටේඩියා හා පහළ ස්ටේඩියා රේඛාවලට මට්ටම් යටියේ පාඨාංක පිළිවෙළින් 1.62 හා 1.22 ලෙස සටහන් කරන ලදී. මනින ලද තිරස් දුර වන්නේ, (k = 100 , C = 0 ලෙස සළකන්න.)

(1) *4m* කි. (2) *40 m* කි. (3) *100m* කි.

(4) *284 m* කි. (5) *400 m*කි.

(47) ආලෝකයේ ගුණාත්මය ශාකවල ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සඳහා බලපායි. ඒ සඳහා ආධාර වන වර්ණාවලියේ අඩංගු වර්ණ යුගල වන්නේ,

(1) නිල් හා රතු ආලෝකය (2) කොළ හා කහ ආලෝකය

(3) තැඹිලි හා රතු ආලෝකය (4) කොළ හා රතු ආලෝකය

(5) තැඹිලි හා කොළ ආලෝකය

(48) තල මේස බිම් මැනුමේ දී භාවිත කරන උපකරණ අඩංගු වන්නේ,

(1) තල මේසය, මට්ටම් යටිය, ලඹය හා ලඹකරුව

(2) ස්වයංක්‍රීය ලෙවලය, මට්ටම් යටිය, පෙල ගැන්වුම් රිටි හා මිනුම් පටිය

(3) තල මේසය, ලඹ කරුව, ලඹය හා ඇලිඩේඩය

(4) මිනුම් පටිය, දෘෂ්ටි චතුරස්‍රය, ලඹය හා ලඹ කරුව

(5) තලමේසය, තෙපාව, දෘෂ්ටි චතුරස්‍රය, මාලිමාව

(49) විසිතුරු ජලජ පැලෑටි වගා කිරීමේ දී භාවිතා කරන සෙවන දැල්හි සෙවන ප්‍රතිශතය විය යුත්තේ,

(1) 40% - 50% (2) 20% - 30% (3) 60% - 70%

(4) 30% - 40% (5) 70% - 80%

(50) උපරිම ඉඩ ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා බෘඝධර නිර්මාණය කළ යුත්තේ,

(1) වෘත්තාකාර හැඩයට ය. (2) සමචතුරස්‍රාකාර හැඩයට ය.

(3) සෘජුකෝණාස්‍රාකාර හැඩයට ය. (4) ත්‍රිකෝණාකාර හැඩය ටය

(5) අක්‍රමවත් හැඩයට ය.

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**ජෛව පද්ධති තාක්ෂණවේදය - II**
**Bio systems Technology - II**

**16 S II**

පැය 03යි
**Three hours**

විභාග අංකය : ....................................................................

***සැලකිය යුතුයි.***

- **සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

(01) (A) වර්ෂාපතනය ජෛව පද්ධති කෙරෙහි බලපාන ප්‍රධාන දේශගුණික සාධකයකි. පහත රූප සටහනෙහි දක්වා ඇත්තේ ස්වයංක්‍රීය වර්ෂාමානයකි.




(1) A, B, C කොටස් නම් කරන්න.

A ..............................................................................

B ..............................................................................

C ..............................................................................

( 1 x 3)

(2) ජෛව පද්ධති කෙරෙහි වර්ෂාව නිසා වන හිතකර බලපෑම් තුනක් ලියන්න.

(i) ..............................................................................

(ii) ..............................................................................

(iii) ..............................................................................

(3 x 3)

(3) ජෛව පද්ධති කෙරෙහි වර්ෂාව නිසා වන අහිතකර බලපෑම් තුනක් ලියන්න.

(i) ..............................................................................

(ii) ..............................................................................

(iii) ..............................................................................

(3 x 3)



agaram.lk

Agaram.lk - Keep your dreams alive!

(B) පසෙහි පවතින වැදගත් භෞතික ගුණාංගයක් ලෙස දෘශ්‍ය ඝනත්වය සලකනු ලැබේ.
පාංශු දෘශ්‍ය ඝනත්වය සෙවීමේ පරීක්ෂණයක දී ලද පාඨාංක පහත දැක්වේ.

ගැල්වනයිස් බටයේ විෂ්කම්භය = 6cm

ගැල්වනයිස් බටයේ උස = 10cm

ගැල්වනයිස් බටය තුළට ලබා ගත් පස් නියැදියේ වියළි ස්කන්ධය = 424.28g

(1) පසෙහි දෘශ්‍ය ඝනත්වය සඳහා ප්‍රකාශයක් සඳහන් කරන්න.

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

(ලකුණු 02)

(2) පසෙහි දෘශ්‍ය ඝනත්වය ගණනය කරන්න.

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

(ලකුණු 03)

(3) පස් නියැදියේ වියළි ස්කන්ධය ලබා ගන්නේ කෙසේ ද?

................................................................................................................................

................................................................................................................................

(ලකුණු 03)

(4) පස් නියැදිය ලබා ගැනීම සඳහා ගැල්වනයිස් බටයක් භාවිත කිරීමට හේතුව සඳහන් කරන්න.

................................................................................................................................

................................................................................................................................

(ලකුණු 03)

(5) ඉහත පසෙහි සත්‍ය ඝණත්වය 2.3 $gcm^{-3}$ ට නම්, පසෙහි සවිවරතාවය ගණනය කරන්න.

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

(ලකුණු 03)

(6) දෘශ්‍ය ඝනත්වය සහ සවිවරතාවයෙහි වැදගත්කමක් බැගින් සඳහන් කරන්න.

................................................................................................................................

................................................................................................................................

(කරුණු 2 x ලකුණු 2 = ලකුණු 04)

(ලකුණු 18)

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(C) පසක පවතින වැලි, මැටි, රොන්මඩ අංශුවල සාපේක්ෂ අනුපාතය පාංශු වයනය ලෙස හැඳින්වේ.

(1) පාංශු වයනය නිර්ණය කිරීමේ ක්‍රම දෙකක් සඳහන් කරන්න.

........................................................................................................................................

........................................................................................................................................

(කරුණු 1 x ලකුණු 2 = ලකුණු 02)

වයනය සෙවීමේ දී පසෙහි තෙතමන සාධකය සෙවීම අවශ්‍ය වේ. තෙතමන සාධකය නිර්ණය කිරීම සඳහා ලබාගත් පාඨාංක පහත දැක්වේ.

| | | |
|---|---|---|
| තෙතමන බඳුනේ ස්කන්ධය | = | 20g |
| තෙතමන බඳුන + තෙත් පස්වල ස්කන්ධය | = | 135g |
| උඳුනක $105^0C$ උෂ්ණත්වයේ තබා නියත ස්කන්ධයක් ලැබුණු පසු ස්කන්ධය | = | 90g |

(2) පසෙහි තෙතමන ප්‍රමාණය ගණනය කරන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

(ලකුණු 03)

(3) තෙතමන සාධකය ගණනය කරන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

(ලකුණු 03)

(4) පස් නියැදියෙහි වියළි ස්කන්ධය තෙතමන සාධකය ඇසුරින් ගණනය කරන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

(ලකුණු 03)

(5) මෙම පරීක්ෂණයේ දී භාවිත කරනු ලබන රසායන ද්‍රව්‍ය දෙකක් සහ එම ද්‍රව්‍ය එක් කිරීමට හේතු දෙකක් සඳහන් කරන්න.

| *රසායන ද්‍රව්‍යය* | *එක් කිරීමට හේතුව* |
|---|---|
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |

(ලකුණු 1 x 4 = ලකුණු 04)

(6) පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පස් නියැදියේ වැලි 30% ක් ද රොන්මඩ 20% ක් ද මැටි 50% ක් ද ලෙස ලැබුණි. පසෙහි වයනය වයන ත්‍රිකෝණය භාවිතයෙන් නිර්ණය කරන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk




2.3 රූපය - සම්මත වයන ත්‍රිකෝණය

(ලකුණු 03)

(7) එම පසෙහි කෘෂිකාර්මික ගැටලු දෙකක් සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(කරුණු 2 x ලකුණු 2 = ලකුණු 04)

(8) එම ගැටලු මඟහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(කරුණු 2 x ලකුණු 2 = ලකුණු 04)

(D) විවිධ පාරිසරික හා ජෛවීය බලපෑම් හේතුවෙන් පස නිරතුරුව ම රසායනික වෙනස්වීම්වලට ලක්වෙමින් පවතී.

(1) පසෙහි රසායනික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(කරුණු 2 x ලකුණු 2 = ලකුණු 04)

(2) පසෙහි පවතින ප්‍රධාන කලිල වර්ග දෙක නම් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(1 x 2 = ලකුණු 02)

(3) එම කල්ලි වර්ග දෙක අතර වෙනස්කම් දෙක බැගින් සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(2 x 2 = ලකුණු 04)

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

(02) (A) භූමියක වර්ගඵලය ගණනය කිරීම සඳහා, භූමිය මැනීම සිදුකරනු ලබයි.







**P** **Q**

(1) ඉහත රූප සටහන්වලට අදාළ වන බිම් මැනුම් ක්‍රමවේදය කුමක් ද?

..........................................................................................

(ලකුණු 03)

(2) ඔබ සඳහන් කළ බිම් මැනුම් ක්‍රමවේදයට අදාළව ඉහත P හා Q දත්ත එකතු කරන, ක්‍රම සඳහන් කරන්න.

P ..........................................................................................

Q ..........................................................................................

(3 x 2 = ලකුණු 06)

(3) ඉහත බිම් මැනුම් ක්‍රමය භාවිතයේ **ප්‍රධානතම** වාසිය සඳහන් කරන්න.

..........................................................................................

(ලකුණු 04)

(B) දම්වැල් මැනුමේ දී රේඛීය දුරවල් පමණක් භාවිතයෙන් ඉඩමක් මැන වර්ගඵලය සෙවීම සිදුකරයි.

(1) දම්වැල් බිම්මැනීමේ දී භාවිත වන පහත වචන කෙටියෙන් අර්ථ දක්වන්න.

A) පාදම් රේඛාව - ..........................................................................................

B) ප්‍රධාන මැනුම් ස්ථාන - ..........................................................................................

C) පිරික්සුම් රේඛා - ..........................................................................................

D) අනුලම්බ - ..........................................................................................

(ලකුණු 4 x 3 = 12)

(2) දම්වැල් බිම් මැනුමේ දී භාවිත කළ හැකි දම්වැල් වර්ග 03ක් සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

(ලකුණු 2 x 3 = 6)

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(3) දම්වැල් බිම් මැනීමේ වාසි හා අවාසි 02ක බැගින් සඳහන් කරන්න.

| වාසි | අවාසි |
|---|---|
| (i) .................................................. <br> (ii) .................................................. | (i) .................................................. <br> (ii) .................................................. |

(ලකුණු 3 x 4 = 12)

(C) ලක්ෂ්‍ය දෙකක් අතර මට්ටම් වෙනස සෙවීම සඳහා, උපකරණය පිහිටුවා ඇති තලයට සාපේක්ෂව මට්ටම් වෙනස ලබා ගැනීම සිදු කරයි.

| මට්ටම් ස්ථානය | පසු දැක්ම (BS) | පෙර දැක්ම (FS) | උපකරණ උස | ඌනිත මට්ටම | විස්තරය |
|---|---|---|---|---|---|
| 1 | 2.65 | - | ...................... | 100.00 | TBM |
| 2 | 1.50 | 1.31 | ...................... | ...................... | P ලක්ෂ්‍යය |
| 3 | 0.75 | 1.85 | ...................... | ...................... | Q ලක්ෂ්‍යය |
| 4 | 1.20 | 0.95 | ...................... | ...................... | R ලක්ෂ්‍යය |
| 5 | - | 0.60 | ...................... | ...................... | S ලක්ෂ්‍යය |

(1) ඉහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 2 x 8 = 16)

(2) ඉහත මට්ටම් ගැනීම සිදු කරන ලද්දේ ජල වහන කාණුවක් ඉදිකිරීම සඳහා නම්, එම භූමිය පිහිටි ආකාරයට ම භාවිත කිරීම සුදුසු වේ ද?

..........................................................................................................................

(ලකුණු 03)

(3) ඔබගේ නිගමනයට හේතුව දක්වන්න.

..........................................................................................................................

(ලකුණු 04)

(4) ඉහත අවස්ථාවට අමතරව මට්ටම් ගැනීම භාවිත කරනු ලබන වෙනත් අවස්ථා 03ක් සඳහන් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(ලකුණු 3 x 3 = 09)

(03) (A) සමාන උච්චත්ව ඇති ලක්ෂ්‍ය යා කරමින් අඳිනු ලබන රේඛාව සමෝච්ඡ රේඛාවකි.

(1) සමෝච්ඡ රේඛා ඇඳීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 03ක් දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(ලකුණු 3 x 3 = 09)

(2) සමෝච්චකරණයේ භාවිත 02ක් සඳහන් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

(ලකුණු 3 x 2 = 06)

Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(3) සමෝච්ඡ රේඛා ඇසුරෙන් වැටියක් නිරූපණය කර පෙන්වන්න.

(ලකුණු 04)

(B) ජලයේ භෞතරසායනික සහ ජෛවීය ගුණාංග ජලයේ ගුණාත්මකභාවය ලෙස අර්ථ දක්වයි.

(1) පහත දැක්වෙන ජල පරාමිත හඳුන්වන්න.

(a) ද්‍රාවීය ඔක්සිජන් (DO)

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 03)

(b) ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD)

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 03)

(2) ජලයේ ජෛවීය ගුණ පරීක්‍ෂා කිරීමේ දී පරීක්‍ෂා කරනු ලබන දර්ශීය ජීවී කාණ්ඩය නම් කරන්න.

..............................................................................................................................

(ලකුණු 03)

(3) ජලයේ ජෛවීය ගුණාංග පරීක්‍ෂා කිරීමේ අරමුණ කුමක් ද?

..............................................................................................................................

(ලකුණු 03)

(C) විවිධ ද්‍රව්‍ය ජලයට එකතු වීම හේතුවෙන් භාවිතයට නුසුදුසු ලෙස එහි ගුණාත්මක බව පිරිහීම ජල දූෂණය ලෙස හඳුන්වයි.

(1) ජල දූෂණය සඳහා හේතුවන අකාබනික දූෂක තුනක් නම් කරන්න.

(i) ..............................................................................................................................

